PDF Compressor Pro

## බස්නාහිර පළාත් පරිවාස හා ළමා රක්‍ෂක සේවා දෙපාර්තමේන්තුවේ පාසල්පති තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්‍ෂක සේවා දෙපාර්තමේන්තුව
යොමු අංකය : බප/පරිළසේ/ආ04/පා. දිනය : 2013.03. 20

1.2 අමාත්‍යාංශය : බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, කාන්තා කටයුතු, පරිවාස හා ළමාරක්‍ෂක සේවා සහ සහා කටයුතු අමාත්‍යාංශය
යොමු අංකය : ඩබ්පීඑච්/ආ05/පරි/බ.ගැ./04 දිනය : 2013.03. 20

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම :
යොමු අංකය : ඩිඑම්එස්/ඩි/පොදු/11-2 දිනය : 2012.12.19

1.4 ප්‍රධාන ලේකම් (බ.ප) නිර්දේශය :
යොමු අංකය : 1/3/5/6(1) දිනය : 2013.05.11

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමු අංකය : දිනය :

1.6 බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමු අංකය : 1/4/2/5/39 දිනය : 2013.11.04

1.7 ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය :
යොමු අංකය : දිනය :

02. පත්කිරීමේ බලධාරියා - බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
ක්‍රියාත්මක වන දිනය - බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලද දින සිට ක්‍රියාත්මක වේ.

03. සේවා ගණය පිළිබඳ විස්තර :

3.1 සේවා ගණය - තෘතීය
3.2 ශ්‍රේණි - විශේෂ ශ්‍රේණිය
3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්‍ෂක සේවා දෙපාර්තමේන්තුව යටතේ ඇති සහතික කල පාසල් වල අනුමත තනතුරු සංඛ්‍යාවට සීමා වන පරිදි හා ජ්‍යෙෂ්ඨ විධායක හා විධායක නිලධාරීන්ගේ කාර්යභාරයට පරිපූරක/ සුසාධ්‍යකාරක/උපස්ථම්භක වන පරිදි එම නිලධාරීන්ගේ අධීක්‍ෂණයට යටත්ව තනතුරු විශේෂිත කොට පවරා දෙනු ලබන පරිපාලනමය/පිරිස් කළමනාකරණය සහ මූල්‍ය කළමනාකරණ කාර්යයන් පැවරෙන නිලධර ගණයකි.

3.4 කාර්යයන් පැවරීම - පළාත් පරිවාස හා ළමාරක්‍ෂක සේවා කොමසාරිස් (බ.ප)

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

PDF Compressor Pro

04. තනතුරෙහි/ තනතුරුවල ස්වභාවය - ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය.

05. වැටුප් :

5.1 වැටුප් කේත අංකය - MN- 7-2006 A (රා.ප.චි.6/2006(iv) අනුව)

5.2 වැටුප් පරිමාණය - රු. 20,030 – 11 x 365 – 18 x 500 - 33045
(කලින් කලට අනුමත කරනු ලබන වැටුප් චක්‍රලේඛ අනුව වැටුප් කේත අංකයන් වෙනස් විය හැකිය)

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | වැටුප් පියවර | වැටුප් තලය (රු.) |
|---|---|---|
| විශේෂ | පියවර 01 | 20,030 |

සටහන:
කලින් කලට අනුමත කරනු ලබන වැටුප් චක්‍රලේඛ අනුව වැටුප් පරිමාණයන් වෙනස් විය හැකිය.

06. සේවා ගණයට අයත් තනතුරු / තනතුර :

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| පාසල්පති | විශේෂ | 02 | අධිකරණය මගින් යොමු කරන ළමුන්, සහතික කල පාසලට අදාල ව්‍යවස්ථාපිත, ශිල්පීය හා මූල්‍යමය සම්පත් නිසි ලෙස මෙහෙයවීමෙන් සංවර්ධනාත්මක ප්‍රවේශයකට යොමු කිරීම සඳහාත්, පුනරුත්ථාපනය කර නැවත සමාජ ගත කිරීම සඳහාත්, සහතික කල පාසල සතු මානව හා භෞතික සම්පත් කළමනාකරණය කරමින් පරිපාලනමය හා අධීක්ෂණ කටයුතු මෙහෙයවීම. |

සටහන :
පළාත් රාජ්‍ය සේවයේ අවශ්‍යතාවයන්ට අනුකූල වන පරිදි කලින් කලට මෙම සංඛ්‍යාව වෙනස් විය හැකිය.

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව - 02

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය ...1/1/4/283 දිනය ...2013/11/19

PDF Compressor Pro

07. බඳවා ගැනීමේ ක්‍රමය :

බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සුදුසුකම් සහිත අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | - |
| සීමිත | 100% |
| කුසලතා | - |

7.2 විවෘත බඳවා ගැනීම් : අදාල නොවේ

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : අදාල නොවේ

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් : අදාල නොවේ

7.2.2.2 වෘත්තීය සුදුසුකම් : අදාල නොවේ

7.2.2.3 පළපුරුද්ද : අදාල නොවේ

7.2.2.4 කායික සුදුසුකම් : අදාල නොවේ

7.2.2.5 වෙනත් : අදාල නොවේ

7.2.3 වයස :

7.2.3.1 අවම සීමාව : අදාල නොවේ

7.2.3.2 උපරිම සීමාව : අදාල නොවේ

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :

7.2.4.1 ලිඛිත විභාගය : අදාල නොවේ

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : අදාල නොවේ

PDF Compressor Pro

7.3 සීමිත බඳවා ගැනීම :

මෙම තනතුර සඳහා බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සුදුසුකම් ලත් අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය - විශේෂ ශ්‍රේණිය

7.3.2 සුදුසුකම් :

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් :

i. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යාව, අපරාධ විද්‍යාව, සමාජ වැඩ, මනෝ විද්‍යාව, මානව විද්‍යාව, ආර්ථික විද්‍යාව, සමාජ අධ්‍යයනය, සමාජ සංඛ්‍යානය, සංවර්ධන අධ්‍යාපනය, ජනගහන විද්‍යාව, සාමය හා ගැටුම් නිරාකරණය යන විෂයන්ගෙන් එකක් හෝ කිහිපයක් ඇතුලත්ව සාමාන්‍ය/විශේෂ උපාධියක් ලබා තිබීම.

සහ

ii. ශ්‍රී ලංකා සමාජ සේවා විද්‍යාලයේ (ජාතික සමාජ සංවර්ධන ආයතනය) සමාජ වැඩ පිළිබඳ දෑ අවුරුදු ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම සහ පරිවාස නිළධාරී තනතුරේ වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

iii. අ.පො.ස (උ.පෙළ) විභාගය පැරණි නිර්දේශය විෂයයන් 04 කින් හෝ නව නිර්දේශය විෂයයන් 03 කින් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම, ශ්‍රී ලංකා සමාජ සේවා විද්‍යාලයේ (ජාතික සමාජ සංවර්ධන ආයතනය) සමාජ වැඩ පිළිබඳ දෑ අවුරුදු ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම සහ වෝර්ඩන් හෝ නිවාසාචාර්ය තනතුරක වසර 10ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

iv. වෝර්ඩන් හෝ නිවාසාචාර්ය තනතුරක වසර 15කට වැඩි සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

7.3.2.2 වෘත්තීය සුදුසුකම් : අදාල නොවේ

7.3.2.3 පළපුරුද්ද :

ඉහත 7.3.2.1 යටතේ ඉදිරිපත් කර ඇත.

7.3.2.4 කායික සුදුසුකම් :

i. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් මනා සෞඛ්‍යය තත්වයකින් යුක්ත විය යුතුය.

ii. බස්නාහිර පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

PDF Compressor Pro

7.3.2.5 වෙනත් :

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි. අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර 3 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය තිබිය යුතුය.

ii. පූර්වාසන්න වසර 05ක කාලසීමාව තුල විනය ක්‍රියා මාර්ගයකට ලක් නොවී සිටිය යුතුය.

iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය. එමෙන්ම අයදුම්කරුවන් විසින් සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල සහතික වල පිටපත් අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කල යුතුය.

7.3.3 වයස :

7.3.3.1 අවම වයස : අදාල නොවේ

7.3.3.2 උපරිම වයස : අදාල නොවේ

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය :

7.3.4.1 ලිඛිත විභාගය : අදාල නොවේ

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ

7.3.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් ලත් අභ්‍යන්තර අයදුම් කරුවන්ගෙන් අයදුම්පත් කැඳවා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් පරීක්ෂා කර බලා ඉහළම ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කළ යුතු පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගැනීම සිදු කරනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පිළිබඳ විස්තර ඇමුණුම් අංක 01 හි සඳහන් කර ඇත.

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. රාජකාරි කටයුතු වලදී ආයතනයට දක්වන ලද විශේෂ දායකත්වයන් | 25 | 50% |
| 2. කාර්යය සාධනය ඇගැයීම | 35 | |
| 3. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 40 | |
| එකතුව | 100 | |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

PDF Compressor Pro

සටහන :

මෙම සම්මුඛ පරීක්ෂණයේදී බඳවා ගැනීම් පරිපාටියට අනුකූලව පළ කරනු ලබන නිවේදනයේ/ දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා තිබේද යන්න හා තනතුරට අදාල රාජකාරී ඉටුකිරීමට සුදුසු කායික යෝග්‍යතාවයකින් පසුවන්නේද යන්න පිළිබඳවද පරීක්ෂා කර බැලෙනු ඇත.

7.3.4.4.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : පත් කිරීම් බලධාරියා

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : අභ්‍යන්තර නිවේදනයක් පලකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම් : අදාල නොවේ

7.4.1 බඳවා ගන්නා ශ්‍රේණිය : අදාල නොවේ

7.4.2 සුදුසුකම් :

7.4.2.1 අධ්‍යාපන සුදුසුකම් : අදාල නොවේ

7.4.2.2 වෘත්තිය සුදුසුකම් : අදාල නොවේ

7.4.2.3 පළපුරුද්ද : අදාල නොවේ

7.4.2.4 කායික සුදුසුකම් : අදාල නොවේ

7.4.2.5 වෙනත් : අදාල නොවේ

7.4.3 වයස :

7.4.3.1 අවම සීමාව : අදාල නොවේ

7.4.3.2 උපරිම සීමාව : අදාල නොවේ

7.4.4 බඳවා ගැනීමේ ක්‍රමය :

7.4.4.1 ලිඛිත විභාගය : අදාල නොවේ

7.4.4.2 වෘත්තිය පරීක්ෂණය : අදාල නොවේ

7.4.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ

7.4.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාල නොවේ

7.4.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : අදාල නොවේ

PDF Compressor Pro

08. කාර්යක්ෂමතා කඩඉම් විභාග : අදාල නොවේ

09. භාෂා ප්‍රවීණතාවය :

| භාෂාව | ශ්‍රේණිය | ලබාගත යුතු ප්‍රවීණතාවය |
|---|---|---|
| 1. රාජ්‍ය භාෂාව | 111 | අදාල නොවේ. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | 111 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව අදාල මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |
| 3. සන්ධාන භාෂාව | අදාල නොවේ | |

10. ශ්‍රේණි උසස් කිරීම : අදාල නොවේ

11. තනතුරු වලට පත්කිරීම : අදාල නොවේ

12. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :

ආයතන සංග්‍රහය/බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයටද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයටද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝග වලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝග වලටද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝග වලටද අනුව කටයුතු කළ යුතුය.

13. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපන වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපන වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපන කිසිවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව/ බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

14. අන්තර්ග්‍රහණය කිරීම : අදාල නොවේ

15. මෙම පරිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා තිරණය කරනු ඇත.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
4/14/2019 ... 24/11/17

PDF Compressor Pro

16. අර්ථ නිරූපන :

i. සතුටුදායක සේවා කාලය :

"සතුටුදායක සේවා කාලයක්" යනු රජයේ නිලධරයෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටු කිරීම මගින්ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් නියමිත දිනට සමත්වීම මගින්ද, ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින්ද එම කාලය තුලදී උපයා ගත යුතුව තිබූ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාල සීමාවක් වන්නේය.

ii. සක්‍රිය සේවා කාලය :

"සක්‍රිය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලැබේ.

17. උපලේඛන :

| ඇමුණුම් | විස්තරය |
|---|---|
| ඇමුණුම් 01 | පාසල්පති තනතුරට බඳවා ගැනීමේ (සීමිත) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීමේ ක්‍රමය. |

සකස් කලේ - අත්සන ..............................

පරීක්ෂා කලේ - ..............................

(විෂයභාර මාණ්ඩලික නිලධාරියා)

ආර්.ඩී. ජමින්ද,

සහකාර ලේකම්,

සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යාංශය (බ.ප)

ආර්. ඩී. ජමින්ද
සහකාර ලේකම්
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක සහ සභා කටයුතු අමාත්‍යාංශය
බස්නාහිර පළාත

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන ..............................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම :සුගත් එස්. කුමාර

තනතුර :පරිවාස කොමසාරිස් (වැ.බ)

දිනය :2013.03. 20

නිල මුද්‍රාව :..............................

සුගත් එස්. කුමාර
කොමසාරිස්
පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව
බස්නාහිර පළාත

PDF Compressor Pro

යොමු අංකය : ඩබ්පීඑච්/ආ5/පරි/බ.ගැ/04

බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවෙහි පාසල්පති තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන :..........................................

නම : එම්.සී.එල්. රුද්‍රිගෝ

ලේකම්

සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යාංශය (බ.ප)

දිනය : 2013.03.20

නිල මුද්‍රාව : එම්. සී. එල්. රුද්‍රිගෝ
ලේකම්
සෞඛ්‍ය. දේශීය. වෛද්‍ය. සමාජ සුබසාධන හා කාන්තා කටයුතු. පරිවාස හා ළමාරක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යාංශය බස්නාහිර පළාත
අංක. 175. ස්ටැන්ලි තිලකරත්න මාවත
නුගේගොඩ.

යොමු අංකය : 1/5/5/6(1)

බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවෙහි පාසල්පති තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන :..........................................

නම :..........................................

ප්‍රධාන ලේකම් (බ.ප)

දිනය 2013.05.11

නිල මුද්‍රාව : ජේ. එම්. ඩී. ජයන්ති විජේතුංග
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ලිපි අංකය 1/4/4/2013 දිනය 24/5/13

PDF Compressor Pro

යොමු අංකය : 1/4/2/5/39

බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවෙහි පාසල්පති තනතුර සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇත.

අත්සන :

නම :

ලේකම්

පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප)

දිනය 2013.11.04

නිල මුද්‍රාව

ඩී. රාජපක්ෂ
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

යොමු අංකය : 1/1/4/253

බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවෙහි පාසල්පති තනතුර සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය 2013.11.28 දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදි.

අත්සන :

නම :

ආණ්ඩුකාර ලේකම් (බ.ප)

දිනය 2013/11/28

නිල මුද්‍රාව

සුනිල් අබේවර්ධන,
බ.ප. ආණ්ඩුකාර ලේකම්
බ.ප. ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
98/4, හැව්ලොක් පාර,
කොළඹ 05.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
1/1/4/253 ... 28/11/13

PDF Compressor Pro



**<u>බස්නාහිර පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පාසල්පති තනතුරට බඳවා ගැනීමේ (සීමිත) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දීමේ ක්‍රමය.</u>**

01. විභාගයේ නම : බස්නාහිර පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පාසල්පති තනතුරට බඳවා ගැනීමේ (සීමිත) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

02. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබාදෙන ක්ෂෙත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් :

i. මෙම පරිපාටියේ 7.3.4.4 යටතේ පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දෙන ක්ෂෙත්‍ර :

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු |
|---|---|---|
| 1. රාජකාරි කටයුතු වලදී ආයතනයට දක්වන ලද විශේෂ දායකත්වයන්<br>(එක් දායකත්වයක් සඳහා ලකුණු 5 බැගින්) | 25 | 50 |
| 2. කාර්යය සාධනය ඇගැයීම<br>(උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර 05 සඳහා)<br>ඉතා හොඳයි - ලකුණු 07<br>හොඳයි - ලකුණු 05<br>සතුටුදායකයි - ලකුණු 03 | 35 | |
| 3. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය<br>(වයස් මට්ටම අනුව ළමුන්ගේ කායික හා මානසික චර්යාවන්, ළමා පෝෂණය හා සෞඛ්‍යය, ළමා රැකවරණය, ළමා අයිතිවාසිකම්, ළමුන් මුහුණ දෙන මානසික ගැටළු හා උපදේශනය පිළිබඳ දැනුමද, ළමුන් සමඟ කටයුතු කල යුතු ආකාරය පිළිබඳ අයදුම්කරු තුල තිබිය යුතු ආකල්ප/ අවබෝධයද, මානව හා භෞතික සම්පත් කළමනාකරණය හා පරිපාලනය පිළිබඳ දැනුමද සම්මුඛ පරීක්ෂණයේදී පරීක්ෂා කරනු ලැබේ) | 40 | |
| එකතුව | 100 | |



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී

PDF Compressor Pro

03. සම්මුඛ පරීක්‍ෂණය පවත්වනු ලබන බලධාරියා : පත් කිරීමේ බලධාරියා විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලැබේ.

සටහන:

මෙම තනතුර අතිශයින් සංවේදීව කටයුතු කල යුතු ළමයින්ගේ චර්යා පාලනයට සෘජුව අදාල වන තනතුරකි. මෙම බඳවා ගැනීම් පටිපාටියේ 7.3.4.4 ඡේදයේ සඳහන් ව්‍යුහාත්මක සම්මුඛ පරීක්‍ෂණය පැවැත්වීමේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින්, මෙම තනතුරට අදාල රාජකාරි ඉටු කිරීමට ඇති හැකියාව පිළිබඳව නිශ්චිත ප්‍රශ්න ඉල්ලුම්කරුගෙන් විමසා නිශ්චිත ලකුණු ප්‍රමාණයක් දිය යුතුය. ළමා හිමිකම්/අයිතීන්, ළමයින්ගේ මානසික තත්ත්වය හා ඊතවරණය පිළිබඳ අත්දැකීම් හා ගැඹුරු දැනුමක් ඇති තිදෙනෙකුට නොඅඩු විද්වත් මණ්ඩලයක් පත්විම් බලධාරයා විසින් පත්කොට ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණය පැවැත්විය යුතුය. පළාත් පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව නියෝජනය කරන නිලධාරියා විසින් ලකුණු ලබා දීමක් සිදු නොකල යුතු අතර අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය හා සහතික පරීක්ෂා කිරීමේ කාර්යයේ පමණක් නිරත විය යුතුය.

සකස් කලේ - අත්සන :.........................................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම :කේ.එම්.එන්. වික්‍රමසිංහ

තනතුර :පරිපාලන නිළධාරී

දිනය :2013.03.20

කේ. එම්. එන්. වික්‍රමසිංහ
පරිපාලන නිළධාරී
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමාරක්‍ෂක අමාත්‍යාංශය,
බස්නාහිර පළාත.

පරීක්‍ෂා කලේ - අත්සන :.........................................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම : ආර්.ඩී. ජමින්ද

තනතුර : සහකාර ලේකම්

දිනය : 2013.03.20

ආර්. ඩී. ජමින්ද
සහකාර ලේකම්
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්‍ෂක සහ සභා කටයුතු අමාත්‍යාංශය
බස්නාහිර පළාත

අත්සන :.........................................

(දෙපාර්තමේන්තු ප්‍රධානි)

නම : සුගත් එස්. කුමාර

තනතුර : පරිවාස කොමසාරිස් (වැ.බ)

දිනය : 2013.03.20

නිල මුද්‍රාව :

සුගත් එස්. කුමාර
කොමසාරිස්
පරිවාස හා ළමා රක්‍ෂක සේවා දෙපාර්තමේන්තුව
බස්නාහිර පළාත

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ලොග් අංකය :.V/1/4/253 දිනය :..24/11/13.